**කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා දහය - 2022**

-----------------------------------------------------------------------------

**1 විගණන මතය**

1.1 කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා දහයෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාළව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 10 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 07 ක හිඟ අක්කර බදු එකතු වටිනාකම රු.3,513,520 ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදලක් වශයෙන් දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂවල ලැබිය යුතු අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ යල කන්නයේ පොහොර බෙදාහැරීමේදි පොහොර බෑමේ කුලිය ලෙස රු.1,664,150 ක් කාරක සභා හතක් විසින් ගෙවීම් කර තිබුණි. එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් මුලුමනින්ම අත්හැර තිබුණි. | යල කන්නයේ බෙදා හැරීමේ වියදම් සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කරන බවට නිශ්චිත නොවන බැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වූයේ නැත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.3.3 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථානවල ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.27,793,140 ක් පෙන්වා තිබුණද, එය | ඉදිරි මුදල් වර්ෂවල ඇමුණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවන අවස්ථාවන් පහත දැක්වේ.

| | නීති රිති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරණ ගොවිජන සංවර්ධන දෙපාර්මේන්තුවේ චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 10 ක නිලධාරීන්ගෙන් අයකළ යුතු ඇප මුදල් අයකර නොතිබුණි. | ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| | (i) 44(1) වගන්තිය | එක් එක් ගොවි සංවිධානවල ගිණුම් ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයකු විසින් පරීක්ෂා කළයුතු බව සඳහන් වුවද, ගොවිජන සේවා කාරක සභා 10 ක ගිණුම් පරීක්ෂාවට ලක්කර නොතිබුණි. | ගොවි සංවිධානවල ගිණුම් ගොවිජන සේවා සංවර්ධන නිලධාරී විසින් පරීක්ෂා කිරීමට කටයුතු කර ඇත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 52 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 10 ක ගොවිජන සංවර්ධන ප්‍රදේශ සඳහා කෘෂිකර්ම සැලස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලසුම් ඉදිරි වර්ෂවලදී ගොවිජන සේවා සංවිධානවලින් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) 53 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 10 ක කුඹුරු ඉඩම් නාමලේඛන පිළියෙල කර නොතිබුණි. | කුඹුරු ඉඩම් නාමලේඛන පිළියෙල කිරීමට කටයුතු කර ඇත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iv) 55 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 10 ක පරිපාලන ප්‍රදේශයේ කුඹුරු ඉඩම් මැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් මැනීමේ කටයුතු කරමින් පවති. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා දහයක වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම් එකතුව රු.24,842,397 ක්වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ වියදම් ඉක්මවූ පුනරාවර්තන ආදායම් එකතුව රු.1,262,419 ක් සමග සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 21,579,978 කින් වර්ධනය වී තිබුණි. කාරක සභා අටක ආදායම් අතිරික්තයක් පෙන්නුම් කළද එයට අනුරූපී ඉකුත් වර්ෂයේ කාරක සභා හයක වියදම් අතිරික්තයක් දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්තය වර්ධනයට මෙය හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 08 ක් විසින් 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යා සහ තත්‍ය සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලද අතර, විධිමත් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණු බව විගණනයේදි නිරීක්ෂණ විය. | ඉදිරියේදි අදාල විස්තර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මානව සම්පත් සැලැස්ම නිසිලෙස ක්‍රියාත්මක කර විස්තර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වාහන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 07 කට අදාලව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ උතුරු පලාත් ප්‍රධාන ලේකම්ගෙන් 2010 වර්ෂයේ මධ්‍යස්ථානවලට ලබා දී තිබූ ට්‍රැක්ටර් යන්ත්‍ර 98 ක් මධ්‍යස්ථානයවි විසින් ප්‍රයෝජනයට ගෙන දැනට අළුත්වැඩියා කටයුතු නොකර වර්ෂ 13 ක කාලයක් වාහන අංගනයේ ගාල් කර තිබුණි. තවද, එහි අයිතිය සනාථ කිරීමට වාහන ලියාපදිංචි පොත විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අළුත්වැඩියා කළ යුතු ට්‍රැක්ටර් රථ අළුත්වැඩියා කිරීමටත් ප්‍රයෝජනයට ගත නොහැකි ට්‍රැක්ටර් රථ වෙන්දේසි කිරීමටද, අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | වාහන ප්‍රයෝජනයට ගැනීමටත් එහි අයිතිය තහවුරු කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාරක සභා 02 ක් විසින් නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි නියමිත කාලයතුල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නියමිත කාලය තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් 2020 ජනවාරි 01 දිනැති 02/2020 අංක දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 1981 ඔක්තොම්බර් 16 දිනැති අංක 107 දරණ චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව 01 සිට 16 දක්වා වන ආදායම් නිසිපරිදි හඳුනාගෙන ඇස්තමේන්තුකර සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ අංක 19 දරණ තිරසර සංවර්ධන පනත අනුව තිරසාර සංවර්ධන අරමුණු (2030 වර්ෂයේ) ලඟා කර ගැනීම සඳහා වාර්ෂිකව ක්‍රියාකළ යුතු ඉලක්ක හා එම ඉලක්ක ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සහ එහි ප්‍රගතිය මැනීමට අවශ්‍ය දර්ශක වර්ෂ 05 ක කාලයක් සිට හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 5 ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කරායන්කුලම් ගොවිජන සේවා කාරක සභාවේ, ගොවි සංවිධාන 03 කට අයත් ගොවීන් 41 දෙනෙකුට 2021 වර්ෂයේදි ලබා දී තිබූ එකතුව රු. 1,700,000 ක් වටිනා කෘෂිකර්ම ණය 2022 ජුනි 30 දිනට ප්‍රථම අයකර ගත යුතුවූවද, ඉන් රු. 240,000 ක් වටිනා ණය අයකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රු. 1,295,000 ක් ණය අයකර ගෙන ඇත. ඉතිරි රු. 240,000 ක් අයකිරීමට කටයුතු කරනු ලැබේ. | රු. 240,000 ක ණය මුදල අදාල කාලය තුල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |